# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2041/25 - 2017 ඔක්තෝබර් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2017.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට හෙම්මාතගම ජල සම්පාදන ක්‍රමයේ ජල ගබඩා ටැංකිය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1287.

#### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තල්ගස්පිටිය මුස්ලිම් ගම වසම (44C) ග්‍රාම නිලධාරී වසමේ තල්ගස්පිටිය පණාපුරේ ගමේ පිහිටි අඹදෙනිය වතුයායේ පණාපුරේ කොටස නමැති ඉඩමෙන් සැලසුම් අංක 281 හි කැබලි අංක 35, 36 හා 37 යන සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 46 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම පුඹුරේ කැබලි අංක 13 (ප්‍රවේශ මාර්ගය) ; |
| *නැගෙනහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 38 ; |
| *දකුණට* | : | ගම්වැසියන් හිමිකම් කියන ඉඩම හා මෙම පිඹුරේ කැබලි අංක 34 ; |
| *බටහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 33, 34 හා කැබලි අංක 13 (ප්‍රවේශ මාර්ගය). |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. එම්. එච්. අයිෂා සෙයිලානියා,
අංක 225, කාසල්වීදිය,
බොරැල්ල, කොළඹ 08.

11 - 222

1A - G 26445 — 29 (2017/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය රවුෆ් හකීම් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක : 2033/47 හා 2017.08.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 92 වගන්තිය යටතේ නියමයේ උපලේඛනයේ කැබලි අංක : 01 හා 02 වශයෙන් සඳහන් කර ඇතත්, එය කැබලි අංක : 01 හා 03 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 16 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1270.

11 - 239

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.